උසස් පෙළ

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## නිර්දේශිත නිර්වචන

| ඒකකය | විෂය ක්ෂේත්‍රය | අනු අංකය | විද්වතුන් | නිර්වචනය |
|---|---|---|---|---|
| 01 | සන්නිවේදනය | 01. | හැරල්ඩ් ඩී. ලැස්වෙල් 1948 | කවුරු, කාට, කෙබඳු මාධ්‍යයකින්, කුමන බලපෑමක් යටතේ කුමක් කියයි ද එය සන්නිවේදනයයි. (Who says what in which channel to whom with what effect) |
| | | 02. | ක්ලෝඩ් ෂැනන් සහ වොරන් වීවර් - 1949 | යම් තැනක දී තෝරාගත් පණිවිඩ තවත් තැනක දී ඒ ආකාරයෙන් ම ප්‍රතිනිර්මාණය කිරීම සන්නිවේදනයයි. |
| | | 03. | මහාචාර්ය විල්බර් ශ්‍රාම් 1954 | තොරතුරු ගැබ් වූ සංඥාවන් කරණ කොටගෙන දෙපාර්ශවයක් අතර එක හා සමාන මනෝ වෘත්තියක් ( මානසික තත්ත්වයක්) ඇති වීම සන්නිවේදනයයි. |
| | | 04. | එඩ්වඩ් සැපීර් | සමාජය වූ කලී සන්නිවේදනය හේතුකොටගෙන සන්නිවේදනය තුළින් පවත්වාගෙන යනු ලබන සබඳතා ජාලයකි. වර්යාවට අදාළ සෑම සංස්කෘතික රටාවක් ම හෝ සමාජ චර්යාවට අදාළ සෑම ක්‍රියාවලියක් ම සෘජුව ම හෝ වක්‍රව සන්නිවේදනයට සබඳකම් දක්වයි. |
| 03 | ස්ව සංකල්පය | 05. | එඩ්වර්ට් එම්. රොජර්ස් 1959 | ස්ව සංකල්පය යනු පුද්ගලයා , ඔහුගේ ලක්ෂණ පිළිබඳවත් ඔහු වෙනත් අය හා ඔහුගේ ම ජීවිතයේ වෙනත් අංශ සමඟ දක්වන සම්බන්ධතා පිළිබඳවත් ගොඩනගාගෙන ඇති කිසියම් වටිනාකම්වලින් යුතු වූ සංජානනයන්ගෙන් සකස් වූ සංවිධානාත්මක, සංගත, සංකල්පනීය සමස්තයකි. |
| | | 06. | පර්කි - 1970 | ස්ව සංකල්පය යනු පුද්ගලයකු ඔහු පිළිබඳව සත්‍ය ලෙස සලකනු ලබන වටිනාකම්වලින් යුක්ත වූ විශ්වාසයන්ගෙන් සුසංස් වූ සංකීර්ණ වූ ක්‍රියාකාරී පද්ධතියකි. |
| | | 07. | බර්න් - 1983 | ස්ව සංකල්පය යනු පුද්ගලයකු තම හැකියාවන් නිපුණතාවන්, පෙනුම හා සමාජ පිළිගැනුම් පිළිබඳව දරනු ලබන ආකල්ප , හැඟීම් හා දැනුමයි. |
| 05 | මහජන සම්බන්ධතාව | 08. | බ්‍රිතාන්‍ය මහජන සම්බන්ධතා ආයතනය. | මහජන සම්බන්ධතාව යනු කිසියම් සංවිධානයක් සහ එයට අදාළ ජනතාව අතර අන්‍යොන්‍ය අවබෝධය ස්ථාපිත කර පවත්වාගෙන යාම සඳහා හිතාමතා , සැලසුම් සහගතව ,ඉවසීමෙන් යුතු ව දරනු ලබන ප්‍රයත්නයකි. |
| | | 09. | ඉන්දියානු මහජන සම්බන්ධතා ආයතනය. | මහජන සම්බන්ධතාව යනු යම් සංවිධානයක් සහ එයට අදාළ මහජනයා අතර අන්‍යොන්‍ය අවබෝධය හා කීර්ති නාමය ගොඩ නැඟීම හා පවත්වාගෙන යාමට ගනු ලබන සැලසුම් සහගත සහ කල්පවත්නා සියලු ප්‍රයත්නයන් ය. |

www.artsapi.lk



Scanned by CamScanner

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 06 | සංස්කෘතිය | 10. | රැල්ෆ් ලින්ටන් 1936 | සංස්කෘතිය යනු සමාජීය සාමාජිකයන්ගේ ජීවන ක්‍රමය, ඔවුන් විසින් ඉගෙනගෙන එක්රැස්කොටගෙන ඇත්තාවූත්, පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යන්නා වූ ත් අදහස් හා හුරුපුරුදු ආදිය වේ. |
| | | 11. | බී. මැලිනොවුස්කි. 1945 | සංස්කෘතිය යනු උපකරණ , පාරිභෝගික ද්‍රව්‍ය, විවිධ සමාජ සමූහවල ලක්ෂණ,මානව සංකල්පනා,ශිල්ප, විශ්වාස හා චාරිත්‍රවාරිත්‍රයන්ගෙන් අනුබද්ධ සමස්තය යි. |
| | | 12. | ඊ.බී. ටයිලර් 1871 | සංස්කෘතිය යනු දැනුම , ඇදහිලි, විශ්වාස,කලාව,සදාචාරය,නීතිය, පිරිත්විරිත් හා සමාජයේ සාමාජිකයකු වශයෙන් මිනිසා සාක්ෂාත් කොටගෙන ඇති හුරුපුරුදු හා හැකියාවන් ඇතුළත් සංකීර්ණ සමස්තයයි. |
| 07 | සංවර්ධනය | 14. | මහාචාර්ය විමල් දිසානායක | ජාතික සංවර්ධනය යනු ප්‍රධාන වශයෙන් ම ආර්ථික සංවර්ධනය , සමාජ සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය හා සදාචාරාත්මක සංවර්ධනය යන කොටස්වලින් පරිපූර්ණ වූ සංවර්ධනයයි. |
| | | 15. | ඩඩ්ලි සියර්ස් | සංවර්ධනය යනු දරිද්‍රතාව, සාක්ෂරතා ඥානයේ පහත් මට්ටම ,විරැකියාව. සමාජීය අසමානතාව ආදී පීඩාවලින් සංවර්ධනය වන රටවල ජනතාව මුදා හැරීමයි. |
| | | 16. | පෝල් ස්ට්‍රීවන්ස් | සංවර්ධනය යනු නූතන ලෝකයේ යක්ෂාවේශව සිටින බලවේග කිහිපයකට පහර දීම යි. එම බලවේග නම් මන්දපෝෂණය, නූගත්කම, රෝගාබාධ, මුඩුක්කු, විරැකියාව, හා සමාජ අසමානතාවයි. |
| 10 | මාධ්‍ය සාක්ෂරතාව | 17 | යුරෝපා කොමිසම | මාධ්‍ය සාක්ෂරතාව යනු මාධ්‍යයෙන් සෑම ආකාරයකින් ම ඉදිරිපත් කරන සංදේශ ප්‍රවේශණය කිරීමට, විශ්ලේෂණය කිරීමට, ඇගයුමට හා නිර්මාණය කිරීමට ලබා ගන්නා හැකියාවයි. |

## වෙනත් අර්ථ දැක්වීම්

සංවර්ධන සන්නිවේදනය යනු රටක වේගවත් වෙනසක් ඇති කිරීමට යොදාගත හැකි මානව සන්නිවේදනයට අයත් කලාවක් හා විද්‍යාවක් වේ. ඒ මගින් රටක පුළුල් ආර්ථික හා සමාජ සමානාත්මතාව ඇතිකළ හැකි අතර,මානව අවශ්‍යතා පුළුල් ලෙස සපුරාලිය හැකි ය.

**- සංවර්ධන සන්නිවේදනය - පිලිපීන රාජ්‍ය විශ්ව විශ්ව විද්‍යාලය -**

ලොව පුරා පාරජාතික පරිමාණයෙන් විසරණය, අමුද්‍රව්‍ය,තොරතුරු සබඳතා සහ මාධ්‍ය පද්ධති වශයෙන් ව්‍යාප්ත වීම සන්නිවේදනයේ ගෝලීයකරණයයි.

**- සන්නිවේදනයේ ගෝලීයකරණය -**

www.artsapi.lk



Scanned by CamScanner